පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - චිත්‍ර කලාව

සතිය- 02

ශ්‍රේණිය - 09

සැකසුම - එල්.මහේෂ් විජේවර්ධන

**නිපුණතාවය** - පරිසරයේ පවත්නා ද්‍රව්‍ය සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.

**නිපුණතා මට්ටම** - ස්වාභාවික හා නිර්මිත වස්තූන් සම්පිණ්ඩනාත්මක ව චිත්‍රණය කරයි.

**ක්‍රියාකාරකම** - ඝනකාභ හැඩති වස්තුවක්, ගස්ලබු ගෙඩියක්, අඩක් ජලය පිරවූ වීදුරු බෝතලයක දැමූ ක්‍රෝටන් අත්තක් රේඛාවෙන් අධ්‍යයනය කරමු.

**පැවරුම** - පහත දැක්වෙන පියවර අනුව ක්‍රියාකාරකමෙහි නියැලෙන්න.

1. ඔබ නිවසේ ඇති ඝනකාභ හැඩති වස්තුවක්, ශාක පත්‍ර යදකක්, විවිධ හැඩයේ බඳුන් තුනක් සපයාගන්න.
2. මෙම එක් එක් භාණ්ඩ හොඳින් නිරීක්ෂණය කරමින් ඒවායේ හැඩය, මතුපිට ස්වභාවය, වර්ණය ආදිය පිළිබඳ අවබෝධය ලබාගන්න.
3. ඉහත ලබාගත් අවබෝධය අනුව එම භාණ්ඩ වෙන වෙනම දළ සටහන් අඳින්න.
4. සුදුසු පරිදි ඒවායේ ත්‍රිමාන බව පෙනෙන ලෙස එම දළ සටහන් පැන්සල භාවිතාකරමින් එළිය අඳුර යොදන්න.
5. ඉහත 1, 2, 3, 4 පියවර වලදි ලබාගත් අවබෝධයෙන් ඝනකාභ හැඩති වස්තුවක්, ගස්ලබු ගෙඩියක්, අඩක් ජලය පිරවූ වීදුරු බෝතලයක දැමූ ක්‍රෝටන් අත්තක් සපයා ගෙන ඒවා සම්පිණ්ඩනයක් ලෙස සකසා ඒවායේ සුවිශේෂීතා ඉස්මතු වන පරිදි ඇඳ වර්ණ කරන්න.